සම්මානිත මහාචාර්ය,
කුසුමා කරුණාරත්න
මෙල්බර්න් නගරයේදී



සාහිත්‍යය යනු දරුවකුගේ ලොව සුන්දරත්වයෙන් මෙන්ම චමත්කාරයෙන් ද පුරවා තැබිය හැකි වන විශේෂ මාධ්‍යයකි. එපමණක් ද නොව තරවටු කර අවවාද රැසක් දීමට වඩා සාහිත්‍යය මගින් ඉතා පහසුවෙන්, විනෝදයෙන් හා කුතුහලය සහිතව බොහෝ දේ දරුවාගේ මනස තුළ තැන්පත් කළ හැකි වේ. එමෙන්ම වැඩිහිටියන් මෙන් නොව, කුඩා දරුවෝ එක පොතක් එක් වරක් නොව බොහෝ වරක්, සමහර විට සියවතාවක් පමණාත් කියවා බලති, රස විඳිති. එවිට එම පොතෙහි ඇති යහගුණ, දැනුම, ආකල්ප වර්ධනය, සිරිත් විරිත්, දයාව කරුණාව, සරළ අත්දැකීම් ආදිය, බොහෝ වතාවක් දරුවාගේ සිත තුළ ගැඹුරින් තැන්පත් වෙයි. සමහර විට වැඩිහිටියකු වූ පසුව ද කුඩා කල කියවූ ඒ රසවත් කතා හා සිද්ධීන් ඔහුගේ හෝ ඇයගේ මතකයේ රැඳී පවති.

ළමා සාහිත්‍යයේ වටිනාකම එසේ වුවද වර්තමානයේ දරුවන් බොහෝ විට සාහිත්‍යයයෙන් ඈත් වෙමින්, පරිගණකයට ළං වෙමින් සිටිනු දක්නට ලැබේ. පරිගණකය ඉතා අවශ්‍ය බව සැබෑය, දරුවකු වර්තමානයේ එය හැදෑරිය යුතුමය. එහෙත් ඔවුන් සාහිත්‍යයෙන් ඈත් වීම ඉතා කනගාටුදායක තත්වයකි. ඉන් දරුවාට ළමා කාලයේදී අහිමි වන දේ බොහෝය. මෙයට යම්තාක් දුරට හෝ ප්‍රායෝගික පිළියමක් වන්නේ දරුවන් තාක්ෂණයෙන් මෑත් කරවීම නොව, තාක්ෂණය උපයෝගී කරගෙන හෝ වර්තමාන දරුවා යන මඟ සාහිත්‍යය තැබීමයි. එමෙන්ම

# ශ්‍රී ලාංකික දරු දැරියනට ඊ කතන්දර
# ජානකී සූර්යආරච්චිගෙන්

වර්තමාන දරුවාගේ සිතුම් පැතුම්වලට සරිලන ලෙස දරුවාට සතුට, චමත්කාර්ය, රසඥතාව ගෙන දෙන සාහිත්‍ය පොත පත තව තවත් බිහි කිරීමයි. විශේෂයෙන්ම මෙල්බර්න් නුවර වැනි විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික දරුවන්ට මව්බිමේ සංස්කෘතිය හා සාහිත්‍යය විඳගැනීමට හැකිතාක් ඉඩකඩ සැලසීමයි.

මේ කාරණා ඉතා හොඳින් තේරුම් ගත් සහ ඒ සඳහා බොහෝ දස්කම් දක්වන ශ්‍රී ලාංකික යොවුන් ලේඛිකාවක් ලෙස ජානකී සූර්යආරච්චි හැඳින්විය හැකිය. ඇය මේ වන විට ශ්‍රී ලංකාවේ දරු දැරියන් අතර ඉමහත් ජනප්‍රියත්වයට පත් වී ඇත්තේ ඇයගේ නිර්මාණවල ඇති මේ විශේෂත්වය නිසාමය.

දරුවන්ගේ ලෝකය සුන්දරත්වයෙන් පුරවා තැබිය හැක්කේ සැබවින්ම සුන්දර සිතැත්තන්ටමය. දරුවන් ළංවන්නේ ද සුන්දර සිතැත්තන්ටමය. ඕනෑම රටක දරුවන්ගේ සිත් යමකුට සුන්දරත්වයෙන් පුරවා ලිය හැකි වන්නේ නම් එය සැබැවින්ම වාසනාවකි. දරුවන්ගේ ලොව ආශ්චර්යමත් කරන්නට මෙම ලේඛිකාව ගන්නා උත්සාහයට ඇය රාජ්‍ය සම්මානවලින් මෙන්ම ජපන් බුන්කා සම්මානයෙන් ද පිදුම් ලැබ ඇති අතර අප රට මෙන්ම වෙනත් රටවල ද දෙමව්පියන්ලේ හා දරුවන්ගේ නොමඳ ඇගයීමට ද පාත්‍ර වී ඇත.

මා ඇය අගයන්නේ ඇයගේ ලිවීමේ හා චිත්‍ර ඇඳීමේ හැකියාව නිසා පමණක් නොවේ. ඇය ලියන, අඳින් දේ මෙන්ම ළමා ලෝකය විනිවිද දකින් ආකාරයත් නිසාය. එමෙන්ම එක් එක් දරුවාගේ සිතුම් පැතුම් ඔස්සේ ළමා සිත් උත්තේජනය වන ආකාරය පිළිබඳ, කිසිඳු පූර්ව අත්දැකීමකින් තොරව වුවද පරිකල්පනය කිරීමට හැකි අපූරු කුසලතාවක් ඇය විදහා දක්වන නිසාය.

අවුරුදු 8 දී කුඩා දැරියක වශයෙන් මුල්ම පොත ලියමින් විනෝදාංශයක් ලෙස සාහිත්‍යයට පිවිසි ඇය මේ වන විට ලියා ඇති පොත් සංඛ්‍යාව 200කට ආසන්න වේ. ඇයගේ පොත් සියල්ල කියවා බැලූ විට, කතාවේ රසය නොනසා දරුවාගේ අවධානය රඳවමින්, යහගුණ ද ඊට මුසු කරමින්, ආදරය කරුණාව පමණක් නොව, තාරකා විද්‍යාව, ජල චක්‍රය ආදී විද්‍යා කරුණු ද, ඉතා සැහැල්ලුවෙන් ඇය ළමා මනසට එකතු කරන ආකාරය සැබවින්ම විශේෂ බව කිවයුතු වේ.

ළමා සාහිත්‍යය මගින් එක් අතකින් දරුවන්ට දේශීය සංස්කෘතික සාරධර්ම හා සාම්ප්‍රදායික සමාජ තොරතුරු ගැන අවබෝධයක් සාමන්‍ය තරමින් හෝ ලබා දීම අවශ්‍ය වෙයි. තාක්ෂණික දියුණුව සමඟ ඉදිරියට ගමන් කරන ලෝකයට සරිලන පරිද්දෙන් දරුවන් හුරු කරවිය යුතු ආකාරය ගැන මෙම කතුවරිය දක්වා ඇති අවධානය, ඇයගේ පොත් දෙස බලන කල මැනවින් පැහැදිලි වෙයි.

දරුවන්ගේ දැනුම යහගුණ මෙන්ම රසවින්දනය ද දියුණු කිරීම උදෙසා බෙහෙවින්ම වෙහෙස වන ජානකී විසින් අන්තර්ජාලයට එක් කර ඇති www.tikiri.com 'ඊ කතන්දර' වෙබ් අඩවිය, තාක්ෂණය සමඟ සිටින ශ්‍රී ලාංකික දරුවනට පමණක් නොව, මෙල්බර්න් නගරය වැනි විදෙස් පරිසරවල හැදෙන වැඩෙන ශ්‍රී ලාංකික දරුවන්ට ද ලබා දුන් කදිම අවස්ථාවකි.

දැනට වසර කිහිපයකට පෙර එළිදැක්වුණු එම වෙබ් අඩවිය ශ්‍රී ලංකාවේ මුල්ම ඊ කතදන්දර වෙබ් අඩවිය ලෙස ද හැඳින්විය හැකි වන අතර මේ වන විට ඇයගේ ඊ-ඉදදනි විදේශයන්හි ද ජනප්‍රිය වෙමින් පවති. මෑතකදී ඊඑෂක්‍ය හිදී එළිදැක්වුණු 'ටිවින්කලින්කා - ඩිජිටල් සාහිත්‍ය කෘතිය' ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය දෙකෙන්ම හා සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම රසවිඳිය හැකි අතර ශ්‍රී ලංකාවේ ළමා සාහිත්‍යය ඩිජිටලීකරණය වන මුල්ම අවස්ථාවද මෙය වේ. එය ද ඇගේ ටිකිරි වෙබ් අඩවියේදී රසවිඳිය හැකිය.

සෙල්ලම් බඩු සාප්පුවේ සිටි 'ටිවින්කලින්කා' නම් අපූරු බෝනික්කිය වටා ගෙතුණු සුන්දර කතාවක් වූ එහි තවත් විශේෂයක් වන්නේ කතාවේ පියවරෙන් පියවර දරුවාට නොදැනෙන ලෙස යහගුණ ඇතුළත් කරන ආකාරයයි. මෙහි තවත් විශේෂතා බොහෝමයක් ද ඇති අතර ලොව ඕනෑම රටක දරුවකුට පරිකල්පනයෙන් රස විඳිය හැකි ලෙස මෙහි පසුබිම ද සැකසී තිබේ.

එසේම මෙම ලේඛිකාව ලියා ඇති 'යකා පැංචා' දඟකාර දරුවන් මෙන්ම වැඩිහිටියන්ගේ ද මුවගට නොමඳව සිනා නැංවීමට සමත් වේ. දරුවාට තාරකා විද්‍යා හා ග්‍රහලෝක පිළිබඳ රසවත් ලෙස ලියවුණු 'පිටසක්වල කුමාරයා' ද දරුවන්ට කුඩා කල සිටම සඳ තරු ග්‍රහලෝක පිළිබඳ මනා දැනුමක් නිරායාසයෙන්ම එක් කරයි. ජානකී රචනා කළ 'වැහිළිහිණි පැටියා' නම් ළමා කෘතිය කියවන දරුවකු රසවත් කතන්දරය සමගම වලාකුළුවලින් වැස්ස ලැබෙන ආකාරය ද උගනී. ඇයගේ තවත් කෘතියක් වන 'අච්චාරු හෝටලේ' දරුවන්ගේ ලොවට ගෘහ ආර්ථික විද්‍යාවේ පදනම ඇතුළු බොහෝ දේ නොදැනීම ඉතා රසවත්ව එකතු කරන අයුරු අපූරුය. එවැනි අපහසු මාතෘකා එතරම් සරල ලෙස, ප්‍රහසනය සමග දරුවා නැවත නැවත කියවන තරමට ආශාවක් ඇති කරවන ලෙස ලිවීම, මෙම කතුවරිය සතු සැබෑම දක්ෂතාවකි.

මෙසේ ඇය ලියා සිතුවම් කර ඇති පොත් පෙළේ මා දකින අනෙකුත් විශේෂත්වය වන්නේ ඒ සෑම කෘතියකින්ම පාහේ දරුවාට ආදරණීය සිතිවිලි ඇති කිරීම හා දරුවාගේ යහපත් ගුණ දහම් වඩවන ආකාරයට එහි රසය නොනැසෙන ලෙස රචනා කොට තිබීමයි. බොහෝ පොත්පත ලිවීමේදී අනවශ්‍ය තරමට ගුණාත්මක දේ එක් කිරීමේදී එහි රසය මැකී යයි. එහෙත් ඇයගේ පොත්පත්හි ගුණ මෙන්ම රස ද එකසේ සමබරව පැවතීම තවත් විශේෂත්වයකි.

ජානකී සූර්යආරච්චි ලේඛිකාවගේ පොත්ම කියවා පොතපත කියවීමට හුරු වූ බව කියන දරුවෝ බොහෝ වෙති. පරිගණකයටම හුරු වී සාහිත්‍යයෙන් ඈත්ව යන දරුවන්ට සාහිත්‍යය සමීප කිරීම සඳහා සාහිත්‍යය පරිගණකගත වීම ද ඇයගේ අගනා උත්සාහයක ප්‍රතිඵලයකි. මෑතකදී කාටුන් ලෙස සජීවීකරණය කරන ලද 'දොයි අම්මා' නම් ළමා කෘතිය ශ්‍රී ලාංකික දරුවන්ගේ මෙන්ම මව්වරුන්ගේ ද නොමඳ ආදරයට පාත්‍ර වූ කෘතියකි. සාමාන්‍යයෙන් දරුවන් නළවනු ලබන්නේ අම්මාවරු විසිනි. එහෙත් මෙම පොතෙහි එන සංවේදී කුඩා දියණිය තම අම්මා දවස පුරා වෙහෙසෙන අයුරු දැඩි කනගාටුවෙන් බලා සිට තම අම්මාගේ හිස උකුලේ තබා නැළවීමට ඉදිරිපත් වන අකාරාය ඉතාමත් රසවත්ව, සුරතල් ලෙස ඉදිරිපත් කර ඇත. දරුවා අම්මා නළවන මෙම නැවුම් තේමාව විශ්ව සාහිත්‍යයේ යොදා ගැනෙන මුල්ම අවස්ථාව ලෙස ද හැඳින්විය හැකිය. ලිවීමට, ඇඳීමට පමණක් නොව ගායනයට හා වෙනත් විවිධ අංශවලට ද දස්කම් දක්වන ජානකී මෙම නිර්මාණය ඇගේම මිහිරි හඬින් රසවත් කර ඇති ආකාරය ඉතා පැසසිය යුතු වේ. මෙය ද අඅඅගඑසනසරසගජදප මෙන්ම හදම එමඉැ වෙබ් අඩවියෙන් ද නැරඹිය හැකිය.

මේ අයුරින් ළමා ලෝකය සැබවින්ම සුන්දර කරවන ළමා කෘති විශාල සංඛ්‍යාවක් නිර්මාණය කරමින්, තමන්ම එහි බරපැන දරමින්, එපමණක් ද නොව තමා වෙහෙසී කළ නිර්මාණ ලොව පුරා දරුවන්ට ඉතා ආදරයෙන් නොමිලයේම රසවිඳීමට සලසමින් ජානකී සූර්යආරච්චි ලේඛිකාව විසින් ඉටු කරනු ලබන මෙහෙය සැබවින්ම දෙස් විදෙස් අප සියල්ලන්ගේම ඉමහත් ගෞරවයට පාත්‍ර විය යුතු වේ. ■













